**ශ්‍රී ලංකා කලා මණ්ඩලය - 2015**

**---------------------------------**

ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1987 අංක 44 දරන ශ්‍රී ලංකා කලා මණ්ඩල (සංශෝධන) පනතේ 15(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03**

පෙර කාලපරිච්ඡේද වැරදි සම්බන්ධයෙන් හෙළිදරව් කළයුතු කරුණු හෙළිදරව් කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07**

මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත හා උපකරණවල වටිනාකම නියමිත පන්ති යටතේ සාරාංශ ගතකර ඉදිරිපත් කළ යුතු වුවද රු. 244,203 ක් වටිනා ස්ථාවර වත්කම් එසේ වර්ගීකරණය කර දක්වා නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09**

අවසාන තොගය, පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට ආගණනය කර ගිණුම් ගත කළ යුතු වුවත්, ප්‍රකාශන තොගයේ වටිනාකම එලෙස ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් තොගය රු. 50,331 කින් වැඩියෙන් දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් මුද්‍රණය කර තිබූ ග්‍රන්ථ පිටපත් 144 ක් හා කලා සහරා 116 ක් අවසාන ප්‍රකාශන තොගයට ඇතුලත් කර නොතිබුණි.

(ආ) පිරිවැය රු. 314,166 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් ක්ෂය ගණනය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ක්ෂය කිරීම් රු. 62,833 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) වටිනාකම රු.500,000 ක් වූ ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොලී රු. 17,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) පිරිවැය රු. 8,222 ක් වූ ග්‍රන්ථ පිටපත් 20 ක් අවසාන ප්‍රකාශන තොගයට ගෙන නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත වර්ෂ 04 කට පෙර ආයතන 03 ක් වෙත ලබාදී තිබූ පිරිවැය රු. 26,325 ක් වූ ග්‍රන්ථ 3 ක පිටපත් 90 ක් ආපසු එවීමේ කාලය ඉක්මවී තිබුණද අදාල මුදල අයකර ගැනීමට හෝ පොත් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වන වගන්තිය | සේවකයන් 05 දෙනෙකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් සඳහා සේවායෝජකයාගේ දායකත්වය ගණනය කිරීමේදී වැටුපට ගෙවනු ලබන අන්තර් දීමනා සැලකිල්ලට ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 61,568 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ආ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත | 2014 සැප්තැම්බර් 15 වන දින සිට ස්ථිර සේවයට බඳවාගෙන තිබූ නිලධාරීන් 05 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා පාරිතෝෂික වෙන්කිරීම් කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 756 හා 757 | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන හා 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ | ස්ථාවර වත්කම් සහ පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 1.2 වගන්තිය ප්‍රකාරව ආයතන අධ්‍යක්ෂකගේ හා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සහ කලා මණ්ඩලයේ ස්ථිර සේවකයින් අනුමණ්ඩල කමිටුවලට සහභාගීවීම වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකු හා සේවකයින් දෙදෙනෙකු වෙත එකතුව රු.240,700 ක දීමනා ගෙවා තිබුණි.

(ආ) 1952 අංක 18 දරන පනතින් ශ්‍රී ලංකා කලා මණ්ඩලය පිහිටුවීමේ අරමුණු යටතේ පරිත්‍යාග හා ආධාර වශයෙන් අනුග්‍රහයන් දැක්විය හැකි බවට විධිවිධාන සලසා නොතිබියදී 2015 වර්ෂය තුල කලාකරුවන් 06 දෙනෙකුට පරිත්‍යාග හා අනුග්‍රහයන් සඳහා රු. 180,000 ක් මණ්ඩලයේ අරමුදලින් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය ප්‍රතිඵලය රු.2,079,427 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.265,829 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,345,256 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රේඛීය අමාත්‍යාංශයෙන් අරමුදල් ලැබීම් රු. 2,632,200 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ඌනතාවයක් පැවති නමුත් 2015 වර්ෂයේදී මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂ දක්වා පිළිවෙලින් රු.621,535 ක, රු.381,583 ක, රු.292,428 ක හා රු.628,994 ක දායකත්වයක් පෙන්නුම් කර තිබු අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.4,264,422 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1952 අංක 18 දරන කලා මණ්ඩල පනත අනුව ලලිත කලාවන් පිළිබඳව පෘථුල දැනුමක්, අවබෝධයක් සහ ක්‍රියාකාරිත්වයක් වර්ධනය කර, ශ්‍රී ලාංකික ජනතාව කරා කලා කටයුතු ගෙනයාම දියුණු කිරීම, ලලිත කලා කටයුතුවල තත්ත්වය වැඩි දියුණු කිරීම, ශ්‍රී ලංකාවට ආවේණික කලාවන් සහ කර්මාන්තයන්හි සංවර්ධනය තහවුරු කිරීම, දිරි ගැන්වීම හා උනන්දු කිරීම හා ඉහත සඳහන් අරමුණුවලට ඍජුවම හෝ අනියම්ව අදාල වන කුමන කරුණකදී වුවද, රජයේ දෙපාර්තමේන්තු, ප්‍රාදේශීය බල මණ්ඩල සහ අනෙකුත් ආයතනවලට උපදෙස් දීම මණ්ඩලයේ ප්‍රධාන අරමුණු විය.

(ආ) එහෙත් මණ්ඩලය විසින් ඉහත (අ) හි සඳහන් අරමුණු ලගාකර ගැනීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රසවින්දන වැඩසටහන් 07 ක් සහ කලා සඟරාව මුද්‍රණය කිරීමට අයවැයෙන් රු. 1,570,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද රු.436,000 ක් වියදම් කර රසවින්දන වැඩසටහන් 03 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඈ) විධිමත් ක්‍රමවේදයකට අනුව මණ්ඩලයේ අරමුණු ඉටු කිරීම වෙනුවෙන් ක්‍රියා කිරීමට මණ්ඩලය අපොහොසත්ව තිබුණු අතර පුනරාවර්තන වියදම් දැරීම සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් ලබාදෙන අරමුදල් මණ්ඩලයේ අරමුණු වෙනුවෙන් යෙදවීම කෙරෙහිද නිසි අවධානයක් යොමුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී වාරියපොල පැවැත්වූ දේශීය කලාකරුවන් හඳුනා ගැනීම හා සවිබල ගැන්වීමේ වැඩමුළුව සඳහා රු. 83,598 ක් වැයකර තිබුණද එහි මූලික අරමුණක් වූ වයඹ පළාතේ කලාකරු නාමාවලියක් සකස් කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් ඉටුකර නොතිබුණි.

(ආ) ආයතනයේ වෙබ් අඩවිය පවත්වාගෙන යාම වෙනුවෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත සමාලෝචිත වර්ෂය තුල රු. 13,250 ක් ගෙවා තිබුණද වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සිදුකර නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු තනතුරු 6 ක් සඳහා බඳවා ගැනීමට 2011 අගෝස්තු 26 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබාදී තිබුණි. එහෙත් ප්‍රධාන විධායක නිලධාරී (මණ්ඩලයේ ලේකම්) තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කිරීම සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් සිදුකර නොතිබූ අතර ඒ සඳහා 2014 වර්ෂයේ සිට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරියකු වැඩ බැලීමේ පදනම මත පත් කර තිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම

මණ්ඩලය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.2 ක්‍රියාකාරි සැලැස්ම

2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.1.2. වගන්තිය හා 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 04 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණු අතර රේඛීය අමාත්‍යාංශය විසින්ද අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදයට අනුව ආයතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත හා තථ්‍ය ආදායම් වියදම් අතර සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතා පිළිබඳ මණ්ඩලයේ සභාපතිවරයා වෙත වරින්වර දැනුම්දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | - | ඇතැම් දේපල පිරියත හා උපකරණ ක්ෂය නොකිරීම හා පාරිතෝෂික වෙන් නොකිරීම |
| (ආ) | තොග පාලනය | - | ග්‍රන්ථ හා සඟරා සඳහා තොග ලේඛන පවත්වා නොගැනීම, තොග හඳුනා ගැනීම හා ගිණුම්ගත කිරීම දුර්වල වීම. |
| (ඇ) | අයවැය ලේඛනමය පාලනය | - | අයවැය ලේඛනය තාත්විකව සකස්කර පාලන කාරකයක් ලෙස යොදා නොගැනීම. |
| (ඈ) | අරමුදල් කළමනාකරණය | - | මණ්ඩලයේ අරමුදල් අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය නොකිරීම. |
| (ඉ) | ප්‍රසම්පාදනය | - | ආයතනික සැලසුම් සකස් නොකිරීම සහ සැලසුමකට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම. |